# වැල්ලවාය ප්‍රාදේශීය සභාව

# මොණරාගල දිස්ත්‍රික්කය

-------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 10 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජූලි 16 වැනි දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට වැල්ලවාය ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් ලැබුණු ට්‍රැක්ටර් රථයේ නියම වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොකර රක්ෂණ වටිනාකම වූ රු.1,500,000 ක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

**1.3.2 ගෙවිය යුතු හා ලැබිය යුතු ගිණුම්**

**-------------------------------------**

(අ) 1988 සිට 2000 දක්වා සහ 2002 සිට 2008 දක්වා වර්ෂ 19 ක් සඳහා සභාව විසින් ගෙවිය යුතු රු. 330,812 ක විගණන ගාස්තු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට එමින් තිබූ සභාව විසින් ගෙවිය යුතු රු. 2,117,805 ක ජල ගාස්තු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදලේ ශේෂය රු. 957,412 ක් විය.

(ඈ) 2005 වර්ෂයේ සිට 2013 මාර්තු දක්වා අයකර ගත් රු. 1,813,914 ක් වූ එකතු කළ අගය මත බදු මුදල් දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්ට ප්‍රේෂණය නොකර ගෙවිය යුතු තැන්පත් වශයෙන් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඉ) වර්ෂ ගණනාවක සිට අය නොවී පවතින දැනට සේවයේ නොමැති සේවකයින් 60 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 133,191 ක හිඟ සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

-------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 182,672,702 ක වත්කම් විෂයන් 05 ක්, රු. 34,140,985 ක වගකීම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණ කිරීමට නොහැකිවිය.

1.3.4 **නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.**

**---------------------------------------------**

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි විධි විධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති,රීති රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | |
| i. 19 (1)(i) වගන්තිය | පළාත් පාලන කොමසාරිස්ගේ ලිඛිත පූර්ව අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී ආදේශක හා අනියම් පදනම යටතේ පුස්තකාල සහායක, රියදුරු සහ කම්කරු යන තනතුරු සඳහා සේවකයින් 10 ක් බඳවාගෙන දළ වැටුප්, සේවක අර්ථසාධක හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් ලෙස රු.595,498 ක් ගෙවා තිබුණි. |
| ii. 132 (ඒ) හා (ඔ) වගන්තිය | අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන ශිෂ්‍යාධාර හා වෛද්‍යාධාර වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 425,100 ක් ගෙවීම් කර තිබුණි. |

## 02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,213,369 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 11,668,370 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ අඩුවීම රු. 9,455,001 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

---------------------

### 2.2.1 හිඟ ආදායම්

----------------

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.47,541,689 ක් වූ හිඟ ආදායම් අයකර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්ති වල විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

### 2.2.2 වරිපනම් බදු

--------------

(අ) සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද වරිපනම් බදු ආදායම රු. 5,889,209 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් ප්‍රවර්තන බදු ලෙස රැස්කර තිබුණේ රු. 1,785,076 කි. එය මුළු බිල් කළ වටිනාකමින් සියයට 30 ක් වැනි පහල අගයක ප්‍රතිශතයක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට හිඟ වරිපනම් බදු ආදායම රු. 5,929,812 ක් වූ අතර වර්ෂය තුලදී එම හිඟ ආදායමෙන් රු. 1,828,354 ක් අය කරගෙන තිබුණි. ඒ අනුව අයවීමේ ප්‍රතිශතය සියයට 31 ක් වූ අතර වරිපනම් බදු හිඟය වර්ෂයක් පාසා ඉහල ගොස් තිබුණි.

### 2.2.3 බදු කුලී

--------

**(අ)** සමාලෝචිත වර්ෂය සඳහා වැල්ලවාය සති පොල ටෙන්ඩර් කිරීමකින් තොරව 2013 වර්ෂයේ සතිපොල බඳුගත් බදු කරුටම රු. 1,920,000කට බදු දී තිබුණි.

(ආ) වැල්ලවාය සති පොළෙහි රු. 160,000 ක මාසික බදු වාරිකය ඊළඟ මාසයේ 10 දිනට හෝ ඊට පෙර අයකරගත යුතු වුවත් එසේ කටයුතු කර නොතිබීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අයවිය යුතු රු. 295,600 ක ප්‍රමාද දඩ අය කරගෙන නොතිබුණි.

**2.2.4 කඩ කාමර කුලි**

-------------------

(i) බස් නැවතුම්පල උඩු මහල කඩ කාමර 07 ක් හා නව සාප්පු සංකීර්ණයේ කඩ කාමර 11 ක් බදු දීමට කටයුතු කර නොතිබුණි.

(ii) නව සාප්පු සංකීර්ණයේ අංක 02, 03, 12, 27, 28 හා 29 කඩ කාමර සඳහා මුල් මුදල ගෙවා ඇතත් බදු ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) 1980 දෙසැම්බර් 31 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක 1980/46 දරන චක්‍රලේඛ විධිවිධාන අනුව සභාව සතු කඩ කාමර කුලි තක්සේරු කිරිමට කටයුතු කර නොතිබුණි.

(iv) නව සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 38 හා 39 කඩ කාමර 2013 අගෝස්තු 07 දින සිට ධීවර අමාත්‍යාංශයට ලබාදී තිබුණ ද ඒ සඳහා පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**2.2.5 වෙනත් ආදායම්**

------------------

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 149 වගන්තියේ විධිවිධාන ප්‍රකාර 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇති හෝ එම අධිකාරිය අනුමත කර ඇති බල ප්‍රදේශයේ පවත්වා ගෙන යනු ලබන හෝටල් 01 ක සහ ලැගුම්හල් 04 න් අදාල වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම් වලින් සියයට එක නොඉක්මවන ගාස්තුවක් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 1,409,491 |
| මුද්දර ගාස්තු | 1,424,881 |

## 2.3 අධිභාර

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 172 (3)වගන්තියේ විධි විධාන යටතේ වගකිව යුතු අයවළුන්ට එරෙහිව මා විසින් පනවන ලද අධිභාර අනුව 2014 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණු අධිභාර අගය රු.70,338 ක් විය.

## 03. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

(අ) අංක 32 -1134 දරන ඩයිහට්සු ජීප් රථය අලුත්වැඩියාව සඳහා 2013 මාර්තු 15 දින පෞද්ගලික ආයතනයක් වෙත භාර දී තිබු අතර 2014 ජනවාරි 30 දින රු. 100,000 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. ජීප් රථය අලුත්වැඩියා කිරිමකින් තොරව 2014 අගෝස්තු 27 දින සභාවට රැගෙන විත් සභා භූමියේ ගාල් කර තිබු අතර අත්තිකාරම් මුදල් අය කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 ජනවාරි සිට මැයි 12 දක්වා අංක 252 -6335 දරන සභා කැබ් රථය සඳහා ඩීසල් ලීටර් 3,100 ක් හා තෙල් ලීටර් 10 ක් වෙනුවෙන් රු. 381,009 ක් ගෙවීම් කර තිබු අතර මෙම ඉන්ධන යෙදවීම් පිළිබඳ ධාවන සටහන් විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(ඇ) විදුලිබල අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති ලිපියේ 2.1 වගන්තිය ප්‍රකාරව වීථි ලාම්පු ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා ගාස්තු ගෙවීමේ පදනම මත පළාත් පාලන ආයතන වීථි පහන් ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා සේවා සැපයුම්කරුවෙකු ලෙස කටයුතු කළ යුතු වුවත්, එසේ සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී මේ සඳහා සභා අරමුදලෙන් රු. 534,082 ක් වියදම් දරා තිබු අතර වීථි ලාම්පු ස්ථාපනය කිරීමේදී ස්ථාපන ක්‍රමය සවි කළ යුතු ලාම්පු වර්ගය, සංඛ්‍යාව යනාදිය පිළිබඳව විස්තර වාර්තාගත කර නොතිබුණි.

(ඈ) 2009 , 2013 හා සමාලෝචිත වර්ෂයේ අනියම් හා ආදේශක පදනම් යටතේ විදුලි, කාර්මික, ක්ෂේත්‍ර කම්කරු, සෞඛ්‍ය කම්කරු, යන්ත්‍ර ක්‍රියාකරු හා රියදුරු යන තනතුරු සඳහා බඳවාගෙන තිබු සේවකයන් 11 දෙනෙකු සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 24 දින ස්ථිර සේවයට පත් කර තිබුණ අතර අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් වී නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ ඒ සඳහා දළ වැටුප්, සේවක අර්ථ

සාධක සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් ලෙස රු. 14,692,055ක් ගෙවා තිබුණි.

3.2 අවිධිමත් ගනුදෙනු

----------------------

(අ) සභා අනුමැතියක් සහ පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතියකින් තොරව 2014 ජුනි 20 දින සිට 2014 ජුලි 21 දින දක්වා සභාපතිවරයාගේ රාජකාරි සඳහා අංක KR - 7838 දරන රථය කුලියට ගැනීම සඳහා රු. 120,000 ක් ගෙවා තිබුණි.

(ආ) 2014 අගෝස්තු 01 සිට 31 දක්වා සභාපතිවරයාගේ රාජකාරි සඳහා අංක PF -4182 දරන කැබ් රථය කුලියට ගැනීම වෙනුවෙන් රු. 100,000 ක් ගෙවීම් කර තිබු අතර එම කාල පරිච්ඡේදය සඳහාම අංක 252-6335 දරන සභා කැබ් රථය සඳහාද රු. 15,769 ක් වටිනා ඉන්ධන ලීටර් 130 ක් යොදවා තිබුණි. මේ අනුව එකම කාල පරිච්ඡේදයට වාහන දෙකක් පාවිච්චි කර තිබු අතර ධාවන සටහන් නියමිත පරිදි නඩත්තු කර නොතිබු බැවින් යෙදුණු රාජකාරි පිළිබඳව විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඇ) විවිධ කාර්යයන් සඳහා විවිධ ස්ථානවලට යාම වෙනුවෙන් කුලි වාහන කුලියට ගැනීම වෙනුවෙන් පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියකින් තොරව අවස්ථා 04 කදී රු. 78,440 ක් ගෙවා තිබුණි.

(ඈ) 2013 උපමානපාදක සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ පුබුදුවැව පානීය ජල සැපයුම සඳහා රු. 930,550 ක් වැය කර පෞද්ගලික ආයතනයකින් ජල මනු 503ක් මිලදී ගෙන තිබුණි. ජල මනු මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම විධිමත්ව සිදුකර නොතිබු අතර ජල මනු මිලදී ගැනීමට පෙර තාක්ෂණික ඇගයුම් කමිටුවකට යොමු කර නොතිබුණි. මිලදී ගෙන තිබු ජල මනු වෙළඳපලේ පවතින මිලට වඩා වැඩි මිලකට මිලදී ගැනීම නිසා රු. 264,075 ක් වැඩිපුර ගෙවා තිබුණි.

4. **පද්ධති හා පාලන**

**---------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වාහන පාලනය